**පුවත්පත් නිවේදනය**

**මාතෘකාව**

75 වන සංවත්සර සැමරුම ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

**මාතෘකාව හැඳින්වීම**

කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ, ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය මෙවර සිය 75 වැනි සංවත්සරය සමරන බව ගෞරවයෙන් හා අභිමානයෙන් යුතුව දන්වා සිටිමු.

**තේමාව**

75 වසරක උරුමයක් - සෞඛ්‍ය හා යහපැවැත්ම දියුණු කිරීම

**අන්තර්ගතය**

1949 වර්ෂයේ දී ආරම්භ වූ ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය එදා සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ, සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ඉමහත් දායකත්වයක් සපයනු ලබයි. ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය, අප රට තුළ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සියලුම අංශයන් කෙරෙහි ඵලදායී වූ දායකත්වයක් දැක්වූ මධ්‍යස්ථානයක් ලෙස සැලකිය හැකිය. පසුගිය දශකයන් තුළ මෙම අධ්‍යයනාංශය විසින් ප්‍රජා වෛද්‍ය ක්ෂේත්‍රය නංවාලීම සඳහා ඒ හා සම්බන්ධ පුළුල් පරාසයක විහිදුනු සේවාවන්, ක්‍රියාකාරකම්, පුහුණු හා පර්යේෂණ ආදිය මඟින් වැදගත් දායකත්වයක් ලබා දී ඇත. මහජනයාගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා මහජන සෞඛ්‍ය පිළිබඳ නිපුන වෛද්‍යවරුන් පුහුණු කිරීම අධ්‍යයනාංශයේ වගකීම වේ. පිටකෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය (MOH) තුළ අප අධ්‍යයනාංශය විසින් සපයනු ලබන සේවාවන් ජාතික වශයෙන් සෞඛ්‍ය සේවාවන් වල ගුණාත්මකභාවය ඉහළ නංවාලීම සඳහා විශාල දායකත්වයක් ලබා දෙයි. පසුගිය වසර 75ක කාලසීමාව තුළ දී අප අධ්‍යයනාංශය විසින් සිය වෛද්‍ය සිසුන්ගේ ක්ෂේත්‍ර පුහුණුව සඳහා නව භාවිතයන් කිහිපයක් හඳුන්වා දී ඇති අතර ඒවායින් සමහරක් දැන් ජාතික මට්ටමින් සම්මත කර ක්‍රියාත්මක කරනු ඇත. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල (MOH Office) මට්ටමින් මාසික සමුළු සංකල්පය හඳුන්වාදීම, සුව දිවි පියස, වැඩිහිටි සායනය සහ වෘත්තීය සෞඛ්‍ය සායනය ඉන් උදාහරණ කිහිපයකි. ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය විසින් "වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂාව" යන සංකල්පය මූලික කරගනිමින් එයට අදාළ ක්‍රියාකාරකම් 1980 පමණ කාලයේ සිට ආරම්භකර ඇත. තවද, වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ පුහුණු හා පර්යේෂණ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) අනුබද්ධිත මධ්‍යස්ථානයක් ලෙස මෙම අධ්‍යයනාංශය2012 ඔක්තෝම්බර් මාසයේදී නම් කරන ලදි.ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ප්‍රධාන ප්‍රතිපත්ති හා තීරණ සකස් කිරීමට අවශ්‍ය සාක්ෂි මත පදනම් වූ තොරතුරු ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය විසින් පවත්වාගෙන යන සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ඒකකය(HSR unit) විසින් ලබා දීම සිදු කරනු ලබයි.

**සැමරුම් උත්සවයේ සුවිශේෂී වැඩසටහන්**

**1. 75 වැනි සංවත්සර සැමරුම් උත්සවය**

300ක පමණ සහභාගීත්වයෙන් සංවිධානය කෙරෙන 75 වැනි සංවත්සර සැමරුම් උත්සවය 2024 දෙසැම්බර් 3 වන දින පස්වරු 1 සිට 5 දක්වා UCFM ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිතය.

**2. 75 වැනි සංවත්සරය නිමිත්තෙන් සමරු කලාපයක් ප්‍රකාශයට පත් කිරීම**

75 වැනි සංවත්සර සමරු කලාපයක් සමඟ අධ්‍යයනාංශයේ පර්යේෂණ ඇතුළු තවත් ලේඛන මාලාවක් ප්‍රධාන උත්සවයේදී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

**3. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන**

සියලුම ජනමාධ්‍ය මාධ්‍ය හා  සමාජ මාධ්‍ය හරහා මහජනතාව දැනුවත් කිරීම සිදු කෙරේ.ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය කෙරෙහි ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය විසින් දක්වා ඇති දායකත්වය  ප්‍රදර්ශනය කිරීම සඳහා විශේෂ වීඩියෝවක් නිර්මාණය කරනු ලබයි. තවද, වර්තමානයේදී මුහුණදෙනු ලබන මහජන සෞඛ්‍ය ගැටලු පිළිබඳව මාසිකව දැනුවත් කිරීමේ සැසි (webinar) මාලාවක් පැවැත්වීමට නියමිතය.

**4. ඡායාරූප හා චිත්‍ර ප්‍රදර්ශනය**

මෙම ප්‍රදර්ශනය මඟින් ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශයේ කාර්ය භාරය දැක බලා ගැනීමට පීඨයේ සිසුන්, දෙමාපියන්, කාර්යය මණ්ඩලය සහ අනෙකුත් අමුත්තන් ඇතුළු පුළුල් ප්‍රේක්ෂක පිරිසකට අවස්ථාව ලබාදීම මඟින් සමස්ත උත්සවයටම වටිනාකමක් එක් කරනු ඇත.

**5. පිටකෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ (MOH)හි විශේෂ මාසික සමුළුව**

පිටකෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අන්‍යුක්තව සේවයේ නියුතු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය ඇතුළු කාර්යය මණ්ඩලය , එහි සේවයේ නියුතුව සිටි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් , බස්නාහිර පළාත් සෞඛ්‍ය කාර්යය  මණ්ඩලය සඳහා පසුගිය වසර 75 තුළ සිදු කරන ලද සෞඛ්‍ය සේවාවට උපහාරයක් වශයෙන් විශේෂ මාසික සමුළු වැඩසටහනක් සංවිධානය කෙරේ.

**6.  සංස්කෘතික උත්සවයක් හා සුහද හමුවක් පැවැත්වීම**

අධ්‍යයනාශයේ සේවයේ නියුතුව සිට විශ්‍රාම ලබාගත් හා වර්තමානයේ සේවයේ නියුතු කාර්යය මණ්ඩලය අතර සුහදතාවය ගොඩනැංවීම හා දක්ෂතා එළිදැක්වීම සඳහා සංස්කෘතික උත්සවයක් හා  රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්වීම.

**ඔබේ ආයතනයේ/වැඩසටනේ විස්තරය**

මහාචාර්ය උපුල් සෙනරත්, අංශාධිපති, ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

දුරකථන අංකය  -  0112677765

077 073 1821(නිසංසලා  මිය)